ඔස්ට්‍රේලියා රජයේ සිංහල ප්‍රකාශන

යම් කිසි ප්‍රකාශනයක් කිසියම් භාෂාවක සිට තවත් භාෂාවකට පරිවර්තනය කිරීම බැරෑරුම් කටයුත්තකි. ඒ සඳහා අදාල භාෂා දෙක දැන සිටීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා ද්විභාෂාවෙහිම සැඟවී ගත් භාෂා ප්‍රායෝග එක් එක් භාෂාවට ආවේනික වන යෙදුම් ආදී බොහෝ දේ අවශ්‍ය වෙයි.

ඔස්ට්‍රේලියාවේ රජය විසින් විවිධ කාර්යයන් සඳහා නිකුත් කරනු ලබන විවිධ ලියැවිලි සිංහල භාෂාවට පරිවර්තනය කරවා මුද්‍රණයෙන් නිකුත් කරන්නේ සිය බහුසංස්කෘතික ප්‍රතිපත්තියට අනුකූල වන සේ ය. මෙසේ ඉංගිරිසියෙන් සිංහලට පරිවර්තනය කර පළ කර ඇති ඔස්ට්‍රේලියා රජයේ සිංහල ප්‍රකාශන රැසක් මම පසුගිය කාලය තුළ කියවා ඇත්තෙමි. මේ ප්‍රකාශන සම්බන්ධයෙන් මගේ නිරීක්ෂණ රැ සකි.

මේ දක්වා මා කියවා ඇති ඔස්ට්‍රේලියානු රජයේ සිංහල ප්‍රකාශන සියල්ලම බොහෝ වැරදි සහිත පරිවර්තන බව වගකීමෙන් යුතුව ලියා තබන්නට කැමැත්තෙමි. නිවැරදි සිංහලෙන් ලියූ එක ප්‍රකාශනයක්වත් මේ දක්වා මට හමුවී නැත. මේ සෑම ප්‍රකාශනයකම ඇත්තේ වැරදි වලින් ගහණ සිංහල භාෂාවකි.

මේ ප්‍රකාශන පරිවර්තනය කළ අයට සිංහල භාෂාව පිළිබඳව ඇත්තේ ඉතා අඩු දැනුමක් බව පැහැදිළි ය. උපතින් සිංහල වූ පමණින් හා ඉංගිරිසි භාෂාව මැනැවින් පරිහරණය කළ පමණින් සිංහල පරිවර්තකයකු විය නොහැකි ය. ඒ සඳහා සිංහල භාෂාව පිළිබඳ මනා දැනීමක් ද පාසා වියරණ වැරදි අපමණ ය. මේ 7 වන පිටුවේ එන එක ඡෙදයකි. මේ ඡෙදයේ සියලුම වාක්‍ය වැරැදි ය.

"මේ වදන් සමූහයත් සමගම නව පුරවැසියන් ඔස්ට්‍රේලියානු ප්‍රජාවේ කොටසක් බවට පත්වෙති. ඔවුන් ඔස්ට්‍රේලියානු අත්දැකීම් හි කොටසක් බවට පත්වෙති. ඔවුන් නීතියට පක්ෂපාතීත්වය ගරුත්වය සහ අවනතභාවය දැක්වීට පොරොන්දු වෙති. ඔවුන් නිදහස වගකීම් හා වරප්‍රසාදයන් බෙදා හදා ගනිති. "

සෑම පිටුවක් පාසාම මෙවැනි වැරදි වාක්‍ය අපමණ ය. අවම වශයෙන් උක්ත ආඛ්‍යාත සම්බන්ධය ගැන හෝ දැනීමක් පරිවර්තකයාට නැති බව මේ උදාහරණ පෙන්වා දෙයි.

"මෙකී කාරණා පෙරදැටි කොටගෙන රජයේ සහයෝගයත් ඇතිව නව පුරවැසියන්ට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රාථමික දැනුමක් තිබිය යුතු බවට අපේක්ෂා කෙරේ"

මේ අපබ්‍රංස වාක්‍යයෙන් කියැවෙන ආකාරයට "අපේක්ෂා කෙරෙන්නේ" රජයේ සහයෝගයත් ඇතිව ය. අඳෝමැයි.. පරිවර්තකයාට කියන්නට අවශ්‍ය වන්නේ

නව පුරවැසියනට රජයේ අනුග්‍රහය ද ඇතිව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුමක් ලබා දෙන බවත් ඔවුන් එයින් නිසි ප්‍රයෝජන ගෙන ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රාථමික දැනුමක් හෝ ලබා ගත යුතු යයි රජය අපේක්ෂා කරන බව නම් ඉහත වාක්‍යයෙන් එවැනි අදහසක් නොකියවෙන බව ඕනෑම කුඩා දරුවකුට වුවද තිබිය යුතු ය. අවාසනාවට මේ පරිවර්තකයනට නැත්තේම එය බව මේ පරිවර්තන දෙස බලන විට පැහැදිළිවම පෙනී යයි.

මෙල්බන් උතුරු ප්‍රදේශයේ එක්තරා පුස්තකාලයක ඇති DL ප්‍රමාණයේ (A4 කඩදාසියක් තුනට නැවූ විට ලැබෙන ප්‍රමාණය) ඉතා කුඩා සිංහල ප්‍රකාශනයක වැරදි 18 ක් විය.

මා කියවූ අලුත්ම ප්‍රකාශනය ඔස්ට්‍රේලියානු පුරවැසිභාවය ලබා ගැනීමේදී පෙනී සිටිය යුතු පරීක්ෂණයට අදාලව නිකුත් කර ඇති සිංහල ප්‍රකාශනයයි. ඉංගිරිසියෙන් සිංහලට පරිවර්තනය කර ඇති මේ පොත කියවන විට ඇතිවන්නේ කෝපයකට වඩා කණගාටුවකි. ලැජ්ජාවකි. ඉංගිරිසි වචන ගෙඩි පිටින්ම සිංහල වචන වලට දැමීම "පරිවර්තනය" කියා හඳුන්වනවා නම් මේ ප්‍රකාශනය එයට හොඳම උදාහරණයකි. මහාචාර්ය සුවරිත ගම්ලත්ගේ භාෂාවෙන් කියනවා නම් මේවා "හඩු පරිවර්තන" ය.

මේ බලන්න.

" යුතුකම් සහ වරප්‍රසාද සහ ඔස්ට්‍රේලියානු ජන ජීවිතය හා පුරාණවශයෙන් බද්ධ වීම මේ සමග ඇරඹෙනු ඇත" - 5 පිට

7 වන පිටුවේ ඔස්ට්‍රේලියාවු පුරවැසි ප්‍රතිඥාව පරිවර්තනය කර ඇති ආකාරය බලන්න.

"මෙතැන් සිට ඉදිරියට මා ඔස්ට්‍රේලියාවට සහ එහි ජනතාවට හිතෛෂීවන බවටත් ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රික ඇදහිම් මා බෙදාහදා ගන්නා බවටත් ඔවුන්ගේ අයිතීන් සහ නිදහසට මා ගරුකරනා බවටත් සහ ඔවුන්ගේ නීතිය මා පිළිගන්නා බවටත් එයට අවනත වන බවටත් දෙවියන්වහන්සේ ඉදිරියේ ප්‍රතිඥා දෙමි - ඔස්ට්‍රේලියානු පුරවැසිභාව ප්‍රතිඥාව"

මේ පරිවර්තකයන් අක්ෂර වින්‍යාසය හෝ ව්‍යාකරණ හෝ පිළිබඳ කිසිදු තැකීමක් කර ඇති බවක් ද නොපෙනෙයි. ඡෙදයක් ඡෙදයක් තේරුම් යනු ඇත.

මේ ඡෙදයත් බලන්න.

"ආදිවාසී මලළ ක්‍රීඩිකාවක් වූ කැති ෆ්‍රීමන් ඔලිම්පික් කල්දේරම දැළුවුවාය. ක්‍රීඩා තරගයක් සේ සුමට ලෙස ගලායාමට උරදුන් ස්වේච්ඡා සේවකයින් ඔස්ට්‍රේලියාවේ ස්වභාවය තවත් අයුරකින් ලොවට ප්‍රදර්ශනය කලහ" - 27 වන පිට

"ඔලිම්පික් කල්දේරමක්" ඇතැයි කියා මේ ඇසුවාම ය. හැම දේම ප්‍රදර්ශනය කර මුදල් උපයන ඔස්ට්‍රේලියාවට "ඔලිම්පික් කල්දේරම" ප්‍රදර්ශනය කර විශාල මුදල් උපයා ගත හැකි වනු ඇතැයි මට සිතෙයි.

එම ඡෙදයේ දෙවන වාක්‍යයේ තේරුම දන්නේ පරිවර්තකයාම පමණක් යයි සිතමි. එහි ද උක්ත ආඛ්‍යාත සම්බන්ධය ද වැරදි ය.

මේ තවත් එවැනි අපබ්‍රංස වාක්‍යයකි

"නගරයන්හි උස් වේතනයන් ලැබීමේ අවස්ථාව නිතරම පාහේ දුෂ්කර ජීවිත අඩු පාරිතෝෂයන් සහ ආකර්ෂණය නොවන්නක් බවට පත් විය " - 27 වන පිට

30 වන පිටුවේ තවත් අපූරු ඡෙදයක් ඇත

"ඔස්ට්‍රේලියානුවන් වැඩි දෙනෙකු කුසලානය දිනූ අශ්වයාගේ නමින් අවුරුදු ගනන් කරති. උදාර ජයග්‍රාහකයන් ජාතික වීරයන් බවට පත්වේ. ආර්ථික පරිහානියේ පතුලේම සිටි 1930 දී ඔවුන් අතරින් වඩාම ප්‍රසිද්ධ වූ Phar Lap මෙල්බන් කුසලානය දිනා ගත්තේය. " - 30 වන පිට

පරිවර්තකයාට කතා කරන්නට අවශ්‍ය ඇත්තේ අශ්වයකු ගැන ය. එහෙත් මේ පරිවර්තිත ඡෙදයෙන් කියැවෙන්නේ ඔස්ට්‍රේලියානුවන් අතරින් කෙනකු ගැන ය. මේ එම ඡෙදයේ ඊළඟ වාක්‍යයයි.

" ඔහු ප්‍රියතම අශ්වයා ලෙස පටන්ගෙන ඉතා පහසුවෙන් ජයග්‍රහණය කොට අඳුරු කාල පරිච්ඡේදයේ කල් ගත කල ජනයා සතුටට පත්කළේය."

සතකු සිංහල භාෂාවේදී "ඔහු" යනුවෙන් හඳුන්වන්නේ නැත. පරිවර්තකයා එය නොදනියි.

ප්‍රකාශනය පුරා ඇති වැරැදි වචන වලට උදාහරණ ඕනෑ තරම් පෙන්වා දිය හැකි ය. *(ප්‍රථිල්, අත්‍යාවශ්‍ය, වරප්‍රසාදයන්, සාරධර්මයන්, සමානාත්මතාවය, ප්‍රතිපත්තීන්, අනන්‍යතාවයන්, දක්ෂතාවය, අනන්‍යතාවය, පරිඝනකය, මාර්ගයන්, විශිෂ්ඨ, පාලනයන්, සාධකයන් , අවියන්, ධජයයන්, වර්ණයන්, වර්ගයන්, ප්‍රදේශයන්, විෂමතාවයන්, නිදර්ශකයන්)*

පිටුවක් පිටුවක් පාසා දැකිය හැකි වැරදි වලට දිගින් දිගටම උදාහරණ දෙමින් මේ ලිපිය දිග්ගැස්සීමට මම අදහස් නොකරමි. මේ ගැන උනන්දුවක් දක්වන අයට http://www.citizenship.gov.au/test/resource-booklet/citz-booklet-sinhalese.pdf වෙබ් අඩවියට ගොඩ වී මේ අපූරු ප්‍රකාශනය කියවා බැලිය හැකි ය

මේ ව්‍යසනයට ගොදුරුව ඇත්තේ මුද්‍රිත ප්‍රකාශන පමණක් නොවේ. වරින් වර

මේවා පරිවර්තනය කරන්නේ කවුද? - මේ පරිවර්තන අනුමත කරන්නේ කවුද?

මේවා පරිවර්තනය කරන්නේ කවුද? - මේ පරිවර්තන අනුමත කරන්නේ කවුද?

ගුවන් විදුලියෙන් ඇසෙන ඔස්ට්‍රේලියානු රජයේ බොහෝ සිංහල දැන්වීම් ද වැරදි වලින් ගහණ ය,

සිංහල භාෂාවට ආදරය කරන්නකු ලෙස මට ඇසීමට ඇති ප්‍රශ්න මේවා ය.

1 ඔස්ට්‍රේලියානු රජය සිය ප්‍රකාශන සිංහලට පරිවර්තනය කිරීම සඳහා පරිවර්තකයන් තෝරා ගන්නේ කුමන පදනමකින් ද?

2 ඔස්ට්‍රේලියානු රජයට මේ පරිවර්තකයන් නිර්දේශ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

3 කිසිවකු විසින් කරනු ලබන පරිවර්තනයක නිවැරදි බව නැවත පරීක්ෂා කිරීමේ ක්‍රම වේදයක් නැත් ද?

4 මේ හඩු පරිවර්තන සඳහා මේ පරිවර්තකයන් රජයෙන් ලබාගත් ගෙවීම කොපමණ ද?

ඔස්ට්‍රේලියානු රජයට සිංහල විකිණීම වරප්‍රසාද ලත් සිංහලීෂ් සමාජයේ කීප දෙනෙකු අත පවතින ව්‍යාපාරයක් යයි බොහෝ අය පවසති. එය සත්‍යයක් නම් මේවා ගැන ලිවීමෙන් පලක් තිබේදැයි සැක සහිත ය.

වඩා වේදනාවක් එන්නේ ඔස්ට්‍රේලියානු ශ්‍රී ලාංකික සමාජයේ අති දක්ෂ ප්‍රවීණ පරිවර්තකයන් සිටියදී මෙවන් හඩු පරිවර්තන කියවන්නට ලැබීම ගැන ය.

අප කතා කරන ලියන භාෂාව "සිංහල" ය. සුද්දා එය "සිංහලීස්" කළේ ය. අපේ කලු සුද්දන්ට ද එය තවමත් " සිංහලීස්" මය.

ජගත් ජේ එදිරිසිංහ

නමෝත්ථස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!

දිනක් සිය සිඟිති පුතුන් රැගෙන ගෙන බුදුරදුන් හා විවාදයකට පැමිණෙන අභය රාජ කුමාරය බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්න කොට සිටිනවා. ''ශ්‍රමණ භගවත් ගෞතමයන් වහන්සේ ප්‍රියශීලී වචන භාවිතා කරන්නෙක් හැටියට බොහොම ප්‍රසිද්ධයි, ඔබ වහන්සේ සුමුදු වදන් පමණක් තෙපළන්නෙක්ද කියා දැන ගන්න කැමතියි'' යනුවෙන් බුදුපියාණන් වහන්සේ 'ඔව්' යැයි පිළිතුරක් දුන්නොත්, දෙවිදත් තෙරුන් අරහයා බුදුරදුන් කළ රළු ප්‍රකාශ නිදසුනට ගෙන බුදුරදුන් මුසාවාස් තෙපළන්නෙක් යැයි චෝදනා කරන අදහසිනුයි අභයරාජ මෙම පැනය විචාලේ.

යමෙක් ප්‍රශ්නයක් ඇසූ විට පිළිතුරු දෙන ක්‍රම හතරක් බුදුරජාණන් වහන්සේ අනුග මනය කළා. ඉන් එක් ක්‍රමයක් තමයි ප්‍රශ්නයක් නැඟූ පුද්ගලයා වෙත ප්‍රශ්නයක් ඉදිරිපත් කොට පටිපුච්ඡා ක්‍රමයට පිළිතුර ලබා දීම. ඒ ක්‍රමයට අනුව බුදුරදුන් අභයරාජ කුමරුගෙන් අසා සිටිනවා, කුමරුනි, දැන් ඔය ඔබේ අතේ නැළැවෙන පුංචි පුතා තනියම ඉන්න වෙලාවක ළඟ තියෙන ගල් කැටයක් හෝ වෙනයම් දෙයක් අරගෙන උගුරෙ හිරකර ගත්තොත් ඒ වෙලාවට ඔබ මොකද කරන්නේ? දරුවට තවත් වේදනා ගෙන දෙයි කියලා ඒක ඉවත් නොකර ඉන්නවද? එහෙමත් නැත්නම් දරුවා වේදනාවෙන් කෑමොර දෙද්දී, සමහර විට උගුරෙන් ලේ පවා එද්දී ඔබ දරුවාව තදින් අල්ලා ගෙන, උගුරට ඇඟිලි දෙක දාලා ඒ දේ ඉවත් කරනවද?

ශ්‍රමණ භගවත් ගෞතමයන් වහන්ස! ඒක අහන්නත් දෙයක්ද? ඒ වෙලාවට දරුවට යම් වේදනාවක් ගෙන දුන්නත්, දරුවගේ ජීවිතේ බේරගන්න මම දරුවගෙ උගුරට ඇඟිල්ල යවලා ඒ දේ ඉවත් කරනවා.

අභයරාජ කුමරුගෙන් ඒ විදිහට පිළිතුරු ලැබුණම බුදු පියාණන් වහන්සේ වදාරනවා, එහෙනම් කුමරුනි, ඔබේ පැනයට මගේ පිළිතුරත් එයයි. සමහර වෙලාවට නොමගට යන කෙනෙක් සුමගට ගන්න සුමුදු වදන් වලින් පමණක් පුළුවන් වෙන්නෙ නෑ. ටිකක් තද වචන පාවිච්චි කරන්න වෙනවා. වචනයේ බාහිර ස්වරූපය රළු වුණත් හදවතේ පවතින්නේ එහි පුද්ගලයා ගැන අප්‍රමාණ දයාවක්, කරුණාවක්.

දරුවන්ව යහමගට ගන්න සමහර විටක දෙමාපියන්ට ටිකක් දැඩිව සිටින්නට වෙනවා. ශිෂ්‍යයින් හික්මවන ගුරුවරුත් එහෙමයි. අපේ පැරණි කතාවක් තියෙනවා හැඳි නොගා හඳන හොද්ද රස නැතුවා සේ ගහබැණ නොහඳන දරුවාත් සම්පූර්ණ නොවනවා කියලා. ඉන් අදහස් කරන්නේ දරුවනට කොපමණ ආදරය තිබුණත් ඔවුන් කියන කරන හැම දේම ඉවසා අනුමත නොකොට යහපත් මාර්ගය පෙන්වා දිය යුතු බවයි. අපේ දූලා පුතාලත් මේ ගැන හොඳ අවබෝධයක් ඇති කරගන්න ඕනෑ. අපේ දෙමව්පියෝ, අපේ ගුරුවරු අපිට සැරවැර වෙනකොට ඒ ගැන කේන්ති ගන්නෙ නැතුව ඇයි එහෙම කියන්නෙ කියලා බුද්ධිමත්ව හිතලා බලලා වැඩිහිටියන්ගේ අවවාද වලට ඇහුම්කන් දෙන්න පුරුදු වෙන්න ඕනෑ.

යහපත් කතාබහ ඔබේ දිවියට ආශීර්වාදයක් වේවා!!

ඔබ සැමට සම්මා සම්බුදු සරණයි!!

ශාස්ත්‍රපති පූජ්‍ය රත්මලේ පුඤ්ඤරතන හිමි

ජර්මනිය

www.karuna-samadhi.de